අපරාධයක් සම්බන්ධයෙන් නිසි අයුරින් නීතිය ක්‍රියාත්මක කරවීම සහ වැරදිකරුවන්ට නිසි අයුරින් දඬුවම් ලබාදීම යන ක්‍රියාවලියේ දී, සිදුවීම ඇසින් දුටු සාක්ෂිකරුවන් ප්‍රධාන වැදගත්කමක් දරයි.

එබැවින් අදාළ අපරාධයට අදාළ වෙනස් පාර්ශවයන්ගේ බලපෑම් වලින්, බිය ගැන්වීම්වලින් හෝ ශාරීරික තර්ජනවලින් සාක්‍ෂිකරුවන්ව ආරක්ෂා කිරීම, නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම විෂයෙහිදී අවශ්‍යතාවයක් වෙයි.

අප්‍රේල් 19, 2022 දින රඹුක්කන නගරයේදී පැවැත්වුණු විරෝධතාවය අතරතුරදී පොලිසිය විසින් එක් පුද්ගලයෙකුට වෙඩි තැබීමෙන් පසු මරණයට පත්වීම මාධ්‍ය තුළ වාර්තා වූ ආකාරය මීට උදාහරණ ලෙස ගත හැක.

එහිදී, එම සිදුවීම සම්බන්ධයෙන් සාක්ෂි ලබාදිය හැකි සාක්ෂිකරුවන් සිටින බව සහ වාහනවලට ගිනි තැබීම් ඇසින් දුටු සාක්ෂිකරුවන් අධිකරණයට ඉදිරිපත් වූ බව මාධ්‍ය තුළින් අනාවරණය කෙරිණි.

මෙහිදී අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතීඥයන් පොලිසිය මඟින් එම සාක්ෂිකරුවන් වෙත එල්ල විය හැකි බලපෑම්වලින් ආරක්ෂා කර දෙන ලෙසට අධිකරණය හමුවේ ඉල්ලා ඇති බව මාධ්‍ය වාර්තා කරයි.

මේ සම්බන්ධයෙන්, 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත තුළද කරුණු සඳහන් වේ.

එසේ වුවත්, අප්‍රේල් 21, 2022 දින රූපවාහිනී රාත්‍රී ප්‍රධාන සිංහල පුවත් විකාශයන් තුළ, ඇතැම් සාක්ෂිකරුවන්ගේ අනන්‍යතාවයන් හෙළිවන ලෙසින් වාර්තා වී තිබූ ආකාරය මෙසේ දැක්විය හැක.

(සිරස රාත්‍රී 7 පුවත් විකාශයෙහි එක් සාක්ෂිකරුවෙකුගේ අනන්‍යතාවය පූර්ණ වශයෙන් ආරක්ෂා කර තිබූ බවද අපට නිරීක්ෂණය විය.)

මූලාශ්‍ර: https://www.unodc.org/.../front.../protecting-witnesses.html https://youtu.be/Lf_hLVAE9P8
https://youtu.be/Lf_hLVAE9P8
https://www.parliament.lk/.../acts/gbills/sinhala/5971.pdf